# නේෂන්ස් සේවර් ගිණුමේ නියම හා කොන්දේසි

Nations Trust Bank

පහත දැක්වෙන නියම හා කොන්දේසි මගින් (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පි. එල්. සි.-පී. කිව් 118 හි විවෘත කර පවත්වාගෙන යනු ලබන (කවර ආකාරයකින් හෝ නම්කර ඇති) සියලු ඉතිරිකිරිමේ ගිණුම් පාලනය වේ.

1. පාස්පොත් ඉතිරිකිරිමේ ගිණුම් හෝ ප්‍රකාශන ඉතිරිකිරිමේ ගිණුම් වශයෙන් ගිණුම් විවෘත කළ හැකි ය.

2. බැංකුවට පිළිගත හැකි අනන්‍යතාව පෙන්නුම් කරන ලේඛන දෙකකට යොමු වීම මගින් ප්‍රත්‍යක්ෂ ලෙස හඳුනාගැනීම මත බැංකුව විසින් පිළිගනු ලබන තැනැත්තා (තැනැත්තන්) විසින් ගිණුම විවෘත කරනු ලැබිය හැකිය. (උදා: ජාතික හැඳුනුම්පත, වලංගු ගමන් බලපත්‍රයක්, රියදුරු බලපත්‍රයක් සහ ලිපි යැවීමේ ලිපිනය පරීක්ෂා කළ හැකි ලේඛනයක් (උදා මෑතකදී නිකුත් කළ උපයෝගිතා බිල්පතක් බැංකු ප්‍රකාශයක්)

3. (අ) යම් පුද්ගලයකු විසින් ඔහුගේ හෝ ඇගේ නමින් ;

(ආ) මුදල් ආපසු ලබා ගැනීම පිළිබඳව ගිණුම් විවෘත කිරීමේ අයදුම් පතෙහි පැහැදිලි උපදෙස් ලබා දීමට යටත්ව පුද්ගලයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි පිරිසක් විසින් ඒකාබද්ධව ඔවුන්ගේ නම්වලින් ;

(ඇ) සංගමයක් සමාජයක් හෝ සමාන ආකාරයට සීමාසහිත සමාගමක් විසින් එහි නමින් ;

(ඈ) බාල වයස්කාරයකුගේ ප්‍රයෝජනය සඳහා දෙමාපියකු හෝ භාරකරුවකු විසින්,

ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කරනු ලැබිය හැකි ය.

4. සෑම ගිණුමකටම අංකයක් ලබා දෙන අතර එකී අංකය බැංකුව සමග ගනුදෙනු කරන ලිපිවල සහ මුදල් තැන්පත් කිරීමේ ආකෘතිපත්‍රවල හා මුදල් ආපසු ඉල්ලීමේ ආකෘතිපත්‍රවල සඳහන් කළ යුතුය. ගිණුම් හිමියාට දැනුම් දීමක් කිරීමෙන් පසු එකී අංකය වෙනස් කිරීමේ අයිතිය බැංකුව තබා ගනී.

5. ඉතිරි කිරීමේ ගිණුම්වල කාර්ය සඳහා බැංකුව විසින් භාර පිළිගනු නොලැබේ.

6. යම් ඒකාබද්ධ ගිණුමක පාර්ශ්වකරුවෙකු මිය ගිය විට ජීවත්ව සිටින පාර්ශ්වකරු (කරුවන්) විසින් එකී මරණය සිදු වූ දිනය බැංකුව වෙත වහාම දැන්විය යුතු අතර එම ගිණුමට අදාළව සිදු වන ගනුදෙනු දැනට බලපවත්නා නීතිය මගින් පාලනය වේ. තමාගේ නමින් ගිණුමක් විවෘත කර පවත්වාගෙන යන තනි පුද්ගල ගිණුම් හිමියකු විසින් 27 වන වගන්තියේ ඇති විධිවිධානවලට යටත්ව බැංකුව විසින් සපයනු ලබන නම් කිරීමේ ආකෘති පත්‍රයක් පිරවීම මගින් එම ගිණුම් හිමියා මිය ගිය හොත් ගිණුමේ ඇති ශේෂයේ අර්ථලාභියකු ලෙස (අර්ථලාභීන් ලෙස) යම් තැනැත්තකු හෝ තැනැත්තන් නම් කරනු ලැබිය හැකිය.

7. බැංකුව විසින් ගිණුම් හිමියා වෙත පාස් පොතක් හෝ කලින් කල නිකුත් කරනු ලබන ගිණුම් ප්‍රකාශ ලබා දෙන අතර ගිණුම් හිමියා විසින් ඒවා ප්‍රවේශමෙන් ආරක්ෂා කරගත යුතු ය.

<u>පාස්පොත් ඉතිරි කිරීම් සඳහා පමණි.</u>

8. ගිණුම් හිමියා විසින් පාස් පොතෙහි කිසිම සටහනක් නොකළ යුතු අතර බැංකුව විසින් ඉල්ලා සිටිනු ලැබූ විට එය බැංකුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එය පැවරීම හෝ අන්සතු කිරීම කළ නොහැකි ය. තවද ඇපයක් වශයෙන්ද තැබිය නොහැකිය. සටහන්වල නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා සෑම ගනුදෙනුවකටම පසු පාස්පොත පරීක්ෂා කර බැලිය යුතු ය. යම් වැරදි ඇත්නම් එවේලේම බැංකුව වෙත දැනුම් දිය යුතුය. පාස්පොත නැතිවුවහොත් හෝ විනාශ වුවහොත් ගිණුම් හිමියා විසින් වහාම ඒ බව බැංකුවට දැනුම් දිය යුතු ය.

9. මුදල් තැන්පත් කර තිබිය හැකි බැවින් හෝ පාස්පොතේ සටහන් නොකර අයිතමයන් සඳහා මුදල් අයකර තිබිය හැකි බැවින්/හරකර තිබිය හැකි බැවින් ගිණුමේ නිවැරදි ශේෂය පාස්පොතේ සටහන් නොවිය හැකි ය.

10. භාවිත කරනු ලබන පාස්පොත නිතිපතා යාවත්කාලීන කළ යුතුය. පාස්පොතේ අවසන් වරට සටහන් කර ඇති සටහනේ සිට මාස 3 ක් ඇතුළත පාස්පොත යාවත්කාලීන කරනු නොලැබුවහොත් ගනුදෙනුවල වාර්තා හෝ විස්තර පසුව බැංකුවෙන් ඉල්ලා සිටිය හැකි අතර මේ සේවය සඳහා ගාස්තුවක් අයකිරීමේ අයිතිය බැංකුව සතුව පවතී.

<u>ප්‍රකාශන ඉතිරි කිරීමේ ගිණුම් සඳහා පමණි.</u>

11. ප්‍රකාශන වකුය අවසන් වීමේ දින සිට දින 10 ක් ඇතුළත ගිණුම් ප්‍රකාශය නොලැබුණහොත් ඒ බව බැංකුවට දැනුම් දිය යුතුය. සටහන්වල නිරවද්‍යතාවය පිළිබඳව සහතිකවීම සඳහා ලැබෙන එක් එක් ගිණුම් ප්‍රකාශය පරීක්ෂා කිරීමට ගිණුම් හිමියා එකඟ වේ. යම් වැරදි ඇත්නම් ගිණුම් ප්‍රකාශය ලැබී දින 14 ක් ඇතුළත ඒ පිළිබඳව දැනුම් දිය යුතු ය.

12. තමාගේ ගිණුම් ප්‍රකාශවල පිටපත් ආරක්ෂා කර ගැනීම සඳහා ගිණුම්හිමියා වගකිව යුතු ය. බැංකුවෙන් පිටපත් ඉල්ලා සිටිනු ලැබුවහොත් මේ සේවය සැපයීම සඳහා බැංකුව විසින් ප්‍රකාශයට පත් කර ඇති ගාස්තු අනුව ගාස්තු අය කිරීමේ අයිතිය බැංකුව තබා ගනී.

<u>තැන්පතු:</u>

13. බැංකුව වෙත ලියනු නොලැබූ අණකර හෝ වෙනත් ගෙවීම් නියෝග මිලට ගැනීමට හෝ එකතු කිරීම සඳහා යැවීමට බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි තීරණය කරනු ලැබේ. මුදල් ගෙවන බැංකුව විසින් අගරු කරනු ලැබුවහොත් මිලදී ගත් අයිතමයන් සම්බන්ධයෙන් (ගාස්තු අයකිරීම් ඇතුළු) ක්‍රියා මාර්ග ගැනීමේ අයිතිය බැංකුව තබා ගනී. අගරු කිරීමේ දැන්වීම් ලැබුණ විට ගිණුම හර කරනු ලැබේ.

14. බැංකුව වෙත ලියන ලද අණකර/චෙක්පත් සඳහා ගිණුමක බැරට මුදල් ගෙවනු ලැබූ විට බැංකුව විසින් පළ කරන ලද ගාස්තුවලට අනුව බැංකුව විසින් අදාළව ක්‍රියා කිරීමේ ගාස්තු අඩු කර ගනු ලැබේ. එම තැන්පතුවල වටිනා දිනය දැනට පවත්නා බැංකුවේ ප්‍රතිපත්තියට අනුකූලව තීරණය කරනු ලැබේ. බැංකුව වෙත ලියනු නොලැබූ අණකර/චෙක්පත් ඉතිරි කිරීමේ ගිණුමක බැරට මිලදී ගනු ලැබුවහොත් ගිණුම බැර කරන විට සාධන පත්‍රයේ බැලූ බැල්මට පෙනෙන වටිනාකමකින් ක්‍රියා කිරීමේ ගාස්තුවලට අමතරව වට්ටම් ගාස්තුද බැංකුව විසින් අඩු කරනු ලැබේ.

15. පාස්පොත් ඉතිරි කිරීමේ ගිණුමක් සාමාන්‍යයෙන් විවෘත කළ හැකි අවම ආරම්භක තැන්පතුව රු: 10,000/- ක් වන අතර ප්‍රකාශන ඉතිරි කිරීම් ගිණුමක් සාමාන්‍යයෙන් විවෘත කළ හැකි අවම ආරම්භක තැන්පතුව රුපියල් 10,000/- ක් හෝ බැංකුව විසින් කලින් කල තීරණය කරනු ලබන මුදලක් වේ. විශේෂ අවස්ථාවලදී අඩු හෝ වැඩි ආරම්භක තැන්පතු සහිත ගිණුම් විවෘත කිරීම බැංකුව විසින් සිය අභිමතය පරිදි සළකා බලනු ලැබේ. කෙසේ වුවද එකී ගිණුම් 23 වන කොන්දේසියේ අන්තර්ගත විධිවිධානවලට යටත් වේ.

16. තමන් කැමති පරිදි මුදල් තැන්පත් කරනු ලැබිය හැකි ය. ටෙලර් යන්ත්‍රයකින් පාස් පොතේ කරනු ලබන සටහනක් මගින් හෝ තැන්පතු පත්‍රිකාව මත බැංකුවේ බලයලත් කාර්ය මණ්ඩලය විසින් අත්සන් කිරීම මත තැන්පතු පත්‍රිකාව වලංගු කිරීම මගින් සියලු තැන්පතු ලැබුණ බව පිළිගනු ලැබේ. බලයලත් අත්සන් කරුවන්ගේ ලැයිස්තුවක් සහ ටෙලර් යන්ත්‍රයේ මුද්‍රාවේ ආදර්ශයන් ඉල්ලා සිටිනු ලැබූ විට සපයනු ලැබේ.

17. මුදල් තැන්පතු පමණක් භාරගනු ලැබේ. බැංකුව වෙත ලියන ලද සහ අර්ථලාභීන් නම සහ ගිණුම් අංකය සඳහන් කර ඇති චෙක්පත් ශාඛා කළමනාකරුවන්ගේ අනුමැතිය ඇතිව භාරගනු ලැබේ. චෙක්තැන්පතුවලට අවසර දෙනු ලැබුවහොත් චෙක්පතට අදාළ මුදල් ගණුදෙනුකරුගේ ගිණුමට බැර කරනු ලැබුවහොත් මිස (තාවකාලික ලදුපතක් ඉදිරිපත් කරනු ලැබුවද) බැංකු ශාඛාවල පිහිටි චෙක්තැන්පත් කිරීමේ පෙට්ටිවල තැන්පත් කලා යයි කියනු ලබන චෙක්පත සම්බන්ධයෙන් බැංකුව වගකීමකට යටත් නොවේ. තැන්පත් කිරීමේ පෙට්ටිය මගින් නිකුත් කරන ලද තාවකාලික ලදුපත නොතකා එසේ තැන්පත් කරන ලද චෙක්පත් ගණුදෙනුකරුගේ ගිණුමට බැර කර ඇත්නම් මිස චෙක්පත් තැන්පතු කිරීමේ පෙට්ටියෙහි තැන්පත් කලා යයි කියනු ලබන චෙක්පත් සම්බන්ධයෙන් කිසිදු අවස්ථානුගත කරුණක් නිසා කවර හෝ හේතුවක් නිසා බැංකුව විසින් කිසිදු හිමිකම්පෑමක් භාරගනු නොලැබේ. ගණුදෙනුකරුවන්ගේ ගිණුම්වලට බැර කරන ලද චෙක්පත් භාරගනු ලබන්නේ එකතු කිරීම සඳහා පමණකි. චෙක්පත සඳහා වූ මුදල් අදාළ බැංකුවෙන් නිශ්කාශනය කරනතුරු ආපසු ලබා ගැනීමට නොහැකි වනු ඇත. මුදල් ලබාගත හැකි දිනය පෙන්නුම් කරනුයේ පෙන්වා දීමේ කාර්ය සඳහා පමණි ඉතිරි කිරීමේ ගිණුම් චෙක්පත් එකතු කිරීම හා නිශ්කාශනය කිරීම සඳහා අදහස් කරන ලද ඒවා නොවන අතර තැන්පතු චෙක්පත් ලාභාංශ අධිකාරපත්‍ර සහ දරන්නා තැන්පත්කරු හා තුන්වන පාර්ශ්වයන්ට මුදල් ගෙවීම සඳහා ලියන ලද වෙනත් සාධනපත්‍ර භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සතුව පවතී.

<u>මුදල් ආපසු ලබා ගැනීම්.</u>

18. අදාළ රීති සහ නියෝගවලට යටත්ව ඒ. ටී. එම්. යන්ත්‍ර හරහා හෝ ශාඛාවලින් අවශ්‍ය කවර හෝ අවස්ථාවකදී මුදල් ආපසු ලබාගත හැකිය. ඒ. ටී. එම්. කාඩ් ගාස්තු සහ වෙනත් බැංකුවල ඒ. ටී. එම්. යන්ත්‍රවලින් මුදල් ලබා ගැනීම සඳහා වූ ගාස්තු බැංකුවේ දැනට පවත්නා අනුප්‍රමාණ අනුව ගෙවනු ලැබිය යුතුය. යථා පරිදි හඳුනා ගැනීමෙන් පසු සහ පාස් පොතක් නිකුත් කර ඇති ගිණුම් සම්බන්ධයෙන් වන විට පාස්පොත ඉදිරිපත් කිරීමෙන් පසු ශාඛාවලින් මුදල් ආපසු ලබා ගැනීමට අවසර දෙනු ලැබේ. බැංකුව විසින් ස්වකීය තනි අභිමතය මත පාස්පොත් ඉදිරිපත් නොකර බැංකු කවුන්ටර්වලින් මුදල් ලබා ගත හැකිය. (පාස් පොතෙන් ආපසු ගැනීම නොවේ) ශාඛාවලින් පොත් නොමැතිව මුදල් ආපසු ලබා ගැනීම සඳහා බැංකුව විසින් ස්වකීය තනි අභිමතය අනුව ගාස්තුවක් අයකරනු ලැබිය හැකි ය. අදාළ වන අවස්ථාවලදී මුද්දර ගාස්තු සහ වෙනත් බදු හෝ අය කිරීමේ ගිණුම් හිමියා විසින් ගෙවනු ලැබිය යුතු අතර නීතියට අනුව බැංකුව විසින් නිශ්චිතව දක්වා ඇති ආකාරයට එකී මුදල් ගෙවනු ලැබිය යුතු ය. චෙක්පත් හෝ වෙනත් සාධනපත්‍ර මගින් මුදල් ආපසු ගැනීම් කළ නොහැකි ය.

19. ඉහත 17 වන වගන්තියේ අන්තර්ගත නියම කිරීම්වලට යටත්ව ඉතිරි කිරීමේ ගිණුම්වලින් මුදල් හර කරමින් ගෙවීම් කිරීම සඳහා

ගිණුම්හිමියාගෙන් සාධාරණ කාලයක් තුළ තැපෑලෙන් හෝ බැංකු ශාඛාවක් වෙත භාරදීමෙන් ලැබෙන (ස්ථාවර උපදෙස් ඇතුළු) බලයලත් ලිඛිත උපදෙස් මත පමණක් බැංකුව ක්‍රියා කරනු ඇත. නියමිත කාලසීමාව තුළදී එවැනි උපදෙස් අනුව ක්‍රියා කිරීමෙන් පැන නැගුන යම් හිමිකම්පෑමක් පාඩුවක් හෝ පිරිවැයක් සම්බන්ධයෙන් බැංකුව වගකියනු නොලැබේ. බැංකුව සහ ගනුදෙනුකරු අතර විශේෂ ගිවිසුමකින් තොරව ෆැක්ස්, ඊ – මේල් හෝ වෙනත් විද්‍යුත් මාධ්‍යයක් හරහා එවන ලද උපදෙස් බැංකුව විසින් පිළිගනු නොලැබේ.

<u>පොලිය:</u>

20.දෛනික ශේෂය මත දැනට බලපවත්නා අනුපාතය අනුව ගණන් බලනු ලබන පොලිය මාසිකව (මාසයේ අන්තිම දින) ගිණුමට බැර කරනු ලැබේ. පොලී ගෙවීම් 21 සහ 23 යන කොන්දේසිවල අන්තර්ගත විධිවිධානවලට යටත් වේ.

21. දේශීය ආදායම්බදු දෙපාර්තමේන්තුව විසින් නියම කර ඇති පරිදි සියලු ගණුදෙනුකරුවන් විසින් ගිණුම විවෘත කිරීමේ ආකෘති පත්‍රයෙහි බදු තත්වය හා නේවාසික තත්වය පිළිබඳ ව්‍යවස්ථාපිත ප්‍රකාශන ඇතුළත් කළ යුතු ය. ගණුදෙනුකරු විසින් කරන ලද ව්‍යවස්ථාපිත ප්‍රකාශය දැනට පවත්නා සහ අලුතින් විවෘත කරනු ලැබූ සහ එකම ගිනුම් විවෘත කිරීමේ අයදුම්පතින් පාලනය වන ගිණුම්වලට අදාළ වේ. දේශීය ආදායම්බදු දෙපාර්තමේන්තුව හෝ වෙනත් බලපත්‍රලත් ආයතනයක් විසින් නියම කරනු ලැබූ (පොලී අනුපාත අනුව) කාලය සඳහා ගෙවිය යුතු පොලියෙන් රඳවා තබා ගැනීමේ බද්ද හෝ පොලී ගෙවීම් මත ගෙවිය යුතු වෙනත් බදු බැංකුව විසින් අඩු කරනු ලැබිය යුතුය. පසු කලක දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් බැංකුවෙන් ඉල්ලා සිටිනු ලැබුවහොත් නොගෙවා ඇති රඳවා තබා ගැනීමේ බද්ද (දැනුමකින් තොරව) ගණුදෙනුකරුවන්ගෙන් අයකර ගැනීමට බැංකුවට අයිතිය ඇත.

<u>සාමාන්‍යය.</u>

22.ගිණුම් හිමියන්ගේ ලිපිනය වෙනස් වුවහොත් ඒ බව ලිඛිතව වහාම බැංකුව වෙත දැනුම් දිය යුතු ය.

23.යම් ප්‍රකාශ ඉතුරි කිරීම් ගිණුමක ඇති ශේෂය රුපියල් 1,000/– වඩා අඩුවූ විට බැංකුව විසින් සිය අභිමතය පරිදි ගණුදෙනු ගාස්තු සහ/හෝ සේවා ගාස්තු සහ/හෝ රඳවා තබා ගැනීමේ පොලිය අයකරනු ලැබිය යුතුය. බැංකුව විසින් සිය තනි අභිමතය පරිදි ශාඛා කවුන්ටරයේ ගණුදෙනු මත හෝ ඒ ඒ එම් ගණුදෙනු මත වෙන් වශයෙන් වූ ගණුදෙනු ගාස්තුවක් හඳුන්වාදිය යුතු ය. ආරම්භ කළ දින සිට මාස 3 ක කාලයක් තුළ වසා දමන් ලැබූ ගිණුම්වලින් කටයුතු කිරීමේ ගාස්තුවක් අය කරනු ලැබේ. දැනට අදාළ වන අයකිරීම සහ ගාස්තු බැංකුවේ බදු පොතේ සඳහන් වන අතර එය ඉල්ලා සිටීමේ දී බැංකුවෙන් ලබාගත හැකි ය.

24. අයකරනු ලබන සේවා ගාස්තුව අදාළ මාසය තුළදී හෝ ඊළඟ මාසයේ දී ගණුදෙනුකරුගේ ගිණුමෙන් හර කරනු ලැබිය හැකිය.

25.ඉතිරි කිරීමේ ගිණුම්වල දක්නට ඇති ප්‍රකාශනවල සහ/හෝ ගණුදෙනු වාර්තාවල පිටපත් අවුරුදු 7 ක කාලයක් පමණක් බැංකුව විසින් රඳවා තබාගනු ලැබේ. එවැනි වාර්තා වර්ෂ 7 කට පසු විනාශ කරනු ලබන අතර අවුරුදු 7 කට පසු ප්‍රකාශනවල හෝ ගණුදෙනු වාර්තාවල පිටපත් ලබාදීම සඳහා බැංකුව විසින් වගකීම භාරගනු නොලැබේ.

26.තැපෑලෙන් යවන ලද මෙහි සඳහන් යම් දැනවීමක් අවසන් වරට වාර්තාගත වී ඇති ලිපිනයට තැපැල් කළ දින සිට දින 7 ක් ඇතුළත ගිණුම් හිමියාට ලැබුණ ලෙස සළකනු ලැබේ. ලිපියක් මගින් සහ/හෝ දේශීය පුවත් පතක පළ කරන ලද දැන්වීමක් මගින් සහ/හෝ බැංකුවේ දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කිරීම මගින් සහ/හෝ ප්‍රකාශන පණිවුඩ මගින් ගණුදෙනුකරුට ලබා දෙන ලද අයකිරීම් හා ගාස්තුවල වෙනස් කිරීමක් පිළිබඳ දැන්වීමක් සහ/හෝ මෙම නියම හා කොන්දේසි වෙසන් කිරීමක් පිලිබඳ දැන්වීමක් මගින් ගිණුම් හිමියාට එම දැන්වීම ලබා දුන් බවට තේරුම්ගත යුතු ය.

27.බැංකුවේ තනි අභිමතය පරිදි සිදු කරනු ලැබුවහොත් මිස මුදල් තැන්පතු සහ ආපසු ලබා ගැනීම් සඳහා චෙක්පත් තැන්පතු සහ වෙනත් හර කිරීම්/බැර කිරීමේ ගණුදෙනු පිළිබඳව බැංකුව විසින් වෙන් වශයෙන් වූ ලදුපත් ගණුදෙනුකරුවන්ට යවනු නොලැබේ.

28.බැංකුවට ඇති බැරකම් නියම හෝ සම්භාව්‍ය වුවද ප්‍රාථමික හෝ ඒකාබද්ධ වුවද එක්ව හා වෙන් වෙන්ව වුවද බැංකුව විසින් දැන්වීමකින් තොරව බැංකුවට ඇති යම් බැරකමක් ඔබේ ගිණුමක් (ගිණුම) සමග එක් කිරීම හෝ ඒකාබද්ධ කිරීම එවැනි යම් ගිණුම්වලට බැරට ඇති යම් මුදලක් (මුදල්) හෝ වෙනත් යම් ගිණුමක් මත හෝ වෙනත් යම් ආකාරයකට බැංකුවෙන් ඔබට අයවිය යුතු වෙනත් මුදලක් හිලව් කිරීම හෝ පැවරීම කරනු ලැබිය හැකි ය.

29.ගිණුම්හිමියාගේ අවසන් වරට වාර්තා වූ ලිපිනයට දින හතකට කලින් ලිඛිත දැන්වීමක් ලබාදීමෙන් පසු හේතු නොදක්වා යම් ගිණුමක් විවෘත කිරීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සහ/හෝ යම් ගිණුමක් වසා දැමීමේ අයිතිය බැංකුව සතුව පවතී. පාස් පොත් ගිණුම් සම්බන්ධයෙන් වන විට රුපියල් 1,000/– ක අවම ගිණුම් ශේෂයක් ඇති ගිණුම් හිමියකුගේ ගිණුමෙන් මුදල් ගැනීමේ අවහිර කිරීමේ අයිතිය සහ ප්‍රකාශ ඉතිරි කිරීමේ ගිණුමක් සම්බන්ධයෙන් වන විට රු 100/– ක අවම ශේෂයක් ඇති ගිණුම් හිමියෙකුගේ ගිණුමක් මුදල් ගැනීම අවහිර කිරීමේ අයිතිය බැංකුව සතුව පවතී. තවද ගිණුම වසා දමන්නේ නම් මිස අදාළ මුදල් ආපසු ලබා ගැනීමට ගිණුම්හිමියාට හිමිකමක් නැත. අවම ශේෂය සහිතව මුදල් ගැනීම අවහිර කරනු ලැබූ ගිණුම් එක දිගට පවත්වා ගෙන

යනු ලබන අවස්ථාවේදී සහ එවැනි ගිණුම් මාස 3 ක කාලයක් අක්‍රියව පවතින විට ගිණුම් හිමියාගේ අවසන් වරට වාර්තා වූ ලිපිනයට එකී ගිණුම වසා දමන බවට වූ දින 7 ක ලිඛිත දැන්වීමක් ලබා දීමෙන් පසු එවැනි ගිණුම් වසා දැමීමේ අයිතිය බැංකුව සතුව පවතී. එවැනි අවස්ථාවකදී ලිඛිත දැන්වීමේ සඳහන් දින 7 ක කාලය අවසන් වීමට පෙර ගිණුම් හිමියාගෙන් බැහැර කිරීමේ උපදෙස් ලැබුණහොත් මිස ගිණුමේ ශේෂය අවශෝෂනය කිරීමේ අයිතිය බැංකුව සතුව පවතී.

30.නීතිය මගින් ආණ්ඩුවේ නියෝග මගින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් මගින් මෙම නියම සහ කොන්දේසිවලට සංශෝධන කරනු ලැබුවහොත් එම නියම හා කොන්දේසි නිරායාසයෙන්ම සංශෝධනය වේ.

31. ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කරන හෝ පවත්වා ගෙන යන යම් තැනැත්තෙකු විසින් එකී ගිණුම් පාලනය වන බැංකුවේ නියම හා කොන්දේසි කියවා තේරුම් ගෙන ඒවායින් බැඳී සිටින බවට සළකනු ලැබිය යුතුය 26 වන කොන්දේසියේ අන්තර්ගත විධිවිධානවලට යටත්ව මෙම නියම හා කොන්දේසි වෙනස් කිරීමේ සංශෝධනය කිරීමේ හෝ ඊට යමක් එකතු කිරීමේ අයිතිය බැංකුව සතුව පවතී.

32.ගනුදෙනුකරුට අදාළ ගිණුම් තොරතුරු ඇතුලු දත්ත ප්‍රේෂණය කිරීම ගබඩා කිරීම සහ/හෝ ඒවාට ප්‍රවේශවීම පරිපාලනය හා අභ්‍යන්තර නියාමන අවශ්‍යතා ඇතුලු යම් කාර්යයන් සඳහා අවශ්‍ය බව ස්වකීය මතය වන අවස්ථාවක ගණුදෙනුකරුවන්ට අදාළ ගිණුම් තොරතුරු ඇතුලු සියලු දත්ත බැංකුවේ එහි ප්‍රධාන කාර්යාලයේ ශාඛා කාර්යාලවල බලයලත් නිලධාරීන් විසින් නැතහොත් යම් දත්ත පිරිසැකසුම් සේවාවක් මගින් හෝ ගිණුම් ප්‍රකාශ මුද්‍රණය කර තැපැල් කිරීම සඳහා පිරිසැකසුම් සේවාවන් මගින් හෝ ගිණුම් ප්‍රකාශ මුද්‍රණය කර තැපැල් කිරීම සඳහා බැංකුව විසින් යොදවනු ලැබූ යම් තැනැත්තෙකු විසින් හෝ සමාන සේවා සපයන තැනැත්තෙකු විසින් එම තොරතුරු ප්‍රේෂණය කළ හැකි බවටත් සහ/හෝ ගබඩා කළ හැකි බවටත් යම් ස්ථානයනක දරා සිටිය හැකි බවටත් ඒවාට ප්‍රවේශ විය හැකි බවටත් ගණුදෙනුකරු එකඟ වී පිළිගනී.

33.මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම වැළැක්වීමට සහ තහනමට භාජීත වී ඇති පුද්ගලයන්ට හෝ අසථිත්වයන්ට මූල්‍ය හා වෙනත් සේවා සැපයීම වැළැක්වීමට අදාළ නීතිවලට අනුකූලව ක්‍රියා කිරීමට බැංකුවට නියම කර ඇත. එම නිසා බැංකුවේ තනි අභිමතය අනුව එවැනි නීතිවලට හා නියෝගවලට අනුකූලව ක්‍රියා කිරීමට උචිත යයි සළකනු ලබන යම් ක්‍රියා මාර්ගයන් ගැනීමට බැංකුවට හිමිකම් ඇත..

(ස) එම රීති සහ නියෝගවලට අනුකූලව ක්‍රියා කිරීමේදී බැංකුව විසින් උචිත යයි සළකනු ලබන යම් පියවරක් ගැනීමේදී මෙම නියම හා කොන්දේසි යටතේ තම කාර්ය ඉටු කිරීමේ දී බැංකුවට සිදු වූ ප්‍රමාදයකින් හෝ අපොහොසත් වීමකින්,

හෝ

(සස)මේ වගන්තිය යටතේ බැංකුවේ යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීමේදී,

යම් පාර්ශ්වයකට සිදු වූ ලාභ අහිමිවීම හෝ පොලිය අහිමිවීම ඇතුලු) යම් පාඩුවක් හෝ අලාභයන් සම්බන්ධයෙන් බැංකුව වග කියනු නොලැබේ.

අදාළ නීතිවල සහ නියෝගවල මැඩපැවැත්වීමේ නියමයන්ට යටත්ව එවැනි අවස්ථානුගත කරුණු ඇති විට ප්‍රායෝගිකව හැකිතාක් දුරට ගණුදෙනුකරුට දැන්වීමට බැංකුව උත්සාහ කරනු ඇත.

34.යම් ගිණුමකට කරන ලද වැරදි සටහන් ඊලඟ ශේෂ ප්‍රකාශය නිකුත් කිරීමට පෙර හෝ පසුව නැතහොත් පාස්පොත යාවත්කාලීන කිරීමට පෙර හෝ පසුව හර සටහනක් මගින් බැංකුව විසින් එම වැරදි සටහන ප්‍රතිවර්තනය කිරීම නිවැරදි කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකිය. පොලිය ගණන් බැලීම සම්බන්ධයෙන් වන විට වැරදි සටහන කරනු ලැබූ දින සිට බලපාන පරිදි පසු කාලයට බලපාන පරිදි බැංකුව විසින් නිවැරදි කිරීම් කරනු ඇත.

35.මෙහි අන්තර්ගත නියම හා කොන්දේසිවලට අමතරව ගිණුම විවෘත කිරීමට පෙර සියලු ගිණුම්හිමියන් වෙත නිකුත් කරනු ලබන බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසිවල ඇතුළත් නියම හා කොන්දේසිවලින්ද ගිණුම්හිමියා බැඳී සිටී. මෙහි අන්තර්ගත නියම හා කොන්දේසි සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසිවලට ඇතුළත් කර තිබුණද නැති වුවද සියලු නියම හා කොන්දේසිවලින් සම්පූර්ණයෙන් හා සමානව ගිණුම් හිමියා බැඳී සිටී.

බැංකුව සමඟ මගේ ගිවිසුම සංයුක්ත වන නියම හා කොන්දේසි වන සාමාන්‍ය කොන්දේසි සහ මෙම විශේෂ කොන්දේසි මා විසින් කියවා තේරුම්ගත් බවත් ඒවා සටහන් කර ගත් බවත් මම මෙයින් සහතික කරමි.

..............................................

ගිණුම් හිමියාගේ අත්සන

Revised Date : 14/05/2013